**නැගෙනහිර පළාතේ සහභාගිත්ව වෙරළාශ්‍රිත කලාප ප්‍රතිස්ථාපනය හා තිරසාර කළමනාකරණය පිළිබඳ පසු-සුනාමි ශ්‍රී ලංකා ව්‍යාපෘතිය**

---

1. **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මාගේ මතය වනුයේ,

(අ) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 4 ක කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2010 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ආරම්භක තැන්පතුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 4 ක කාල පරිච්ඡේදය සඳහා විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2. **මූල්‍ය ප්‍රකාශන**

-------------------

2.1 **මූල්‍ය කාර්ය සාධනය**

--------------------------

මූල්‍ය ප්‍රකාශනවලට සහ විගණනයට ලබාගත හැකි වු තොරතුරුවලට අනුව, 2010 සැප්තැම්බර් 10 සිට දෙසැම්බර් 31 දක්වා වූ පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘති වියදම රු.3,402,250 ක් විය. සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| සංරචක | 2010 සැප්තැම්බර් 10 සිට දෙසැම්බර් 31 දක්වා වූ පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වියදම |
|---|---|
| | රු. |
| (අ) වාහන හා උපකරණ | 689,620 |
| (ආ) මෙහෙයුම් හා නඩත්තුව | 2,712,630 |
| එකතුව | 3,402,250 |

## 2.2 විශේෂ (ඩොලර්) ගිණුම

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව 2010 සැප්තැම්බර් 10 සිට දෙසැම්බර් 31 දක්වා වූ පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා විශේෂ ඩොලර් ගිණුමේ මෙහෙයුම් හා 2010 දෙසැම්බර් 31 දිනට ගිණුමේ පැවති ශේෂය පහත දැක්වේ.

| විස්තර | එජඩො | රු. |
|---|---|---|
| ආරම්භක තැන්පතුව | 500,000 | 56,740,150 |
| අඩුකළා: ආපසු ගැනීම් | 66,758 | 7,502,198 |
| විදේශ විනිමය පාඩුව | - | 1,168,471 |
| 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය | 433,242 | 48,069,481 |

## 3. විගණන නිරීක්ෂණ

2010 පෙබරවාරි 19 දින ප්‍රසිද්ධ කරන ලද පුවත්පත් දැන්වීමෙහි සඳහන් පරිදි අවශ්‍ය සුදුසුකම් හා පලපුරුද්ද නොමැති නිලධාරීන් 5 දෙනෙකු ව්‍යාපෘතිය සඳහා බඳවාගෙන තිබුණි.

## 4. මූල්‍ය සහ භෞතික කාර්ය සාධනය

### 4.1 අරමුදල් උපයෝජනය

2010 වර්ෂය සඳහා රජයේ ඇස්තමේන්තුවල ශීර්ෂ අංක 139 - නැගෙනහිර පළාත් සභාව යටතේ රු.70,300,000 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණි. සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා සලසන ලද ප්‍රතිපාදනය හා දරන ලද වියදම පහත දැක්වේ.

| සංරචක | වියදම් ශීර්ෂය | විදේශාධාර හා ශ්‍රී ලංකා රජයේ දායකත්වය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2010 සැප්තැම්බර් 10 සිට දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා වියදම | උපයෝජනයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | | රු. | රු. | % |
| මලධන වියදම | 139 | විදේශාධාර | 65,300,000 | 3,400,618 | 5.2 |
| පරිපාලන පිරිවැය හා බදු | 139 | ශ්‍රී ලංකා රජය | 5,000,000 | 1,632 | 0.03 |
| | | | 70,300,000 | 3,402,250 | 4.84 |

## 5. පද්ධති හා පාලන

පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) රාජකාරි වෙන් කිරීම

(ආ) අත්තිකාරම් නිරවුල් කිරීම

(ඇ) ගිණුම් වාර්තා පවත්වාගෙන යාම